# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,948 – 2016 ජනවාරි මස 01 වැනි සිකුරාදා – 2016.01.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

## තනතුරු — ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — වවුනියාව දිස්ත්‍රික්කය
මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 පෙබරවාරි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 දෙසැම්බර් මස 07 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව | වවුනියාව දකුණ කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |

01-12

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - ගාල්ල දිස්ත්‍රික්කය

අංක 1935 හා 2015.10.02 දිනැති *ගැසට් පත්‍රයෙහි* මවිසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2016.02.02 වන දා දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

01-11

---

### නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි III ශ්‍රේණිය සඳහා (විවෘත) බඳවා ගැනීම - 2016**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි පවතින පුරප්පාඩුවට සුදුස්සකු තෝරා ගැනීම සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද කාන්තා අයදුම්කාරියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා අයදුම්කාරිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ පවතින පුරප්පාඩුව සඳහා අනුයුක්ත කරනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''නේවාසිකාගාර පාලිකා තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.02.01 දින වේ.

***සටහන*** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කාරියන් විසින්ම විඳ දරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

''ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සුදුසුකම් ද පරීක්‍ෂා කරනු ලැබේ.''

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| අතිරේක පළපුරුද්ද | 30 |
| භාෂා ප්‍රවීණතාවය | 10 |
| සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

2. *අධ්‍යාපන සුදුසුකම්* :

   1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හය (06) කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්ව තිබීම.

   සහ

   2. අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්ව තිබීම.

3. *වෘත්තීය සුදුසුකම්* :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කළමනාකරණ පිළිබඳව ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පූර්ණ කාලීන 4 වන මට්ටමේ පාඨමාලාවක් හදරා සහතිකයක් ලබා තිබීම.

4. *සේවා පළපුරුද්ද* :

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක අදාළ තනතුරේ/ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

5. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම්* :

   (i) අයදුම්කාරියන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

   (ii) අයදුම්කාරියන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

   (iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-1-2006(ඒ) රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320- රු. 22,040ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

9. *අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය* :

   (i) ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු ය.

   (ii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූළ නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කාරියන්ට උපදෙස් දෙනු ලැබේ.

   (iii) සෑම අයදුම්කාරියකම තම අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360 හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්‍ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

   (iv) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කාරියන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

   (v) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

   (i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දයක මුදල් ගෙවිය යුතු ය.

   (ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත්විය යුතු ය.

   (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014හි විධිවිධානයන්ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතා මට්ටම ලබාගත යුතු ය.

   (iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

11. පුරප්පාඩුව පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් සතුවේ.

12. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ජේ. ඒ. රංජිත්,
අධ්‍යක්‍ෂ ජනරාල්.

2016 ජනවාරි මස 01 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

***කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි III ශ්‍රේණිය සඳහා (විවෘත) බඳවා ගැනීම - 2016***

1. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) කාර්යාලයීය ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   (ii) පෞද්ගලික ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)
3. උපන් දිනය :
   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :————. මාස :————. දින :————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.
8. අධ්‍යාපන සුදුසුකම් :

*අ. පො. ස. (සා. පෙ) විභාගය*
*වර්ෂය* :————. *විභාග අංකය* :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

*අ. පො. ස. (උ. පෙ.) විභාගය*
*වර්ෂය* :————. *විභාග අංකය* :————

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් :

| *විභාගය/ඩිප්ලෝමාව* | *වර්ෂය* | *පෙනී සිටි විෂයන්* | *සාමාර්ථය* | *ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තරය :

| *සේවය කළ ආයතනය* | *තනතුර* | *සේවය කළ කාලය* | *රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක ද යන වග* |
|---|---|---|---|
| | | | |

11. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින් ද/ලියාපදංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න.)

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේ ද?

13. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්‍ෂණ කිසිවක් තිබේ ද?

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................... මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඇය ........... දින මා ඉදිරිපිට දී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි.)

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ...................... මිය/මෙනවිය දැනට ........... තනතුරේ සේවය කරන බවත්, ඇයගේ වැඩ සහ හැසිරීමත් සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)
01-150

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත තරග විභාගය - 2015 / 2016

සීමිත තරග විභාගයක් මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියේ තනතුරුවල පවතින සාමාන්‍ය හා විශේෂ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 515 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 / 2016" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය - 2016.02.01

***සටහන*** - ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) පත්වීම් දීම සඳහා තෝරා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා එම ප්‍රමාණයෙන් 50% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. වාචික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ අංක 10 යටතේ දක්වා ඇත. ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය සඳහා ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව 111 ශ්‍රේණියේ පුරප්පාඩු පුරවනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(ආ) සීමිත තරග විභාගය මඟින් බඳවා ගනු ලබන අයදුම්කරුවන් දකුණ, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර හා උතුර යන පළාත්වල පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ස්ථානගත කරනු ලැබේ.

| *විෂයය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 79 |
| සිංහල | 40 |
| දෙමළ | 41 |
| ඉංග්‍රීසි | 37 |
| ගණිතය | 25 |
| විද්‍යාව | 26 |
| වාණිජ්‍ය විද්‍යාව | 15 |
| ශාරීරික අධ්‍යාපනය | 38 |
| බුද්ධාගම | 23 |
| ක්‍රිස්තියානි | 2 |
| හින්දු | 3 |
| ඉස්ලාම් | 2 |
| සැලසුම් | 31 |
| තොරතුරු තාක්ෂණය | 10 |

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1928/28 සහ 2015.08.21 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධන වලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ 111 වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත්වේ.

(iv) සාමාන්‍ය සේවයේ තනතුරකට පත් කරනු ලබන තැනැත්තකු එසේ පත් කරනු ලැබීමට පෙරාතුව කිසියම් අවස්ථාවක අවම වශයෙන් අවුරුදු 03ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් සේවය කර නොමැත්තේ නම් එසේ පත් කරනු ලැබූ විට වසර 03ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයකු වශයෙන් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කිසියම් තැනැත්තකු එසේ කර තිබූ කාල සීමාව වසර 03 කට වඩා අඩුවන අවස්ථාවක දී එසේ පත් කරනු ලැබීමෙන් පසු සම්පූර්ණ කළ යුතු සේවා කාලය කලින් ඔහු / ඇය විසින් සේවය කළ කාලය හා වසර 03 කාල සීමාව අතර වෙනසට සමාන විය යුතු ය.

(v) 111 ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාවය මත මධ්‍යම රජයේ තනතුරුවලට හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කරනු ලැබේ.

(vi)

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුනක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු ය. සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව 7 පරිශිෂ්ඨයේ දැක්වේ.<br><br>***සටහන*** :<br><br>නිලධාරියෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සමාර්ථයක් ලබා ඇත්නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නිලධාරියෙකු ද මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. |

(vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 හි රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *සුදුසුකම් :*

(අ) පහත සුදුසුකම් සපුරා ඇති රජයේ පාසල්වල, රජයේ අනුමත ආධාර ලබන පාසල්වල හා පිරිවෙන්වල සේවය ස්ථිර කරන ලද ගුරුවරු / විදුහල්පතිවරු සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

***සටහන :***

මෙම අනුග්‍රහය පිරිවෙන් වල සහ ආධාර ලබන පාසල්වල ගුරුවරුන්ට රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබීමට අයිතිවාසිකමක් නොවේ.

4.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සඳහා—
   (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබා ගත් උපාධිය සහිත ගුරුවරයෙකු වීම; හෝ
   (ii) ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය ලබා ඇති ගුරුවරයෙකු වීම; හෝ
   (iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙකු වීම.

(ආ) විශේෂ සේවක සංඛ්‍යාව සඳහා—
   (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් නියමිත විෂයයට අදාළ උපාධිය සහිත ගුරුවරයෙකු වීම; හෝ
   (ii) නියමිත විෂයය පිළිබඳ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු වීම; හෝ
   (iii) තාක්ෂණවේදය විෂයය ධාරාව යටතට ගැනෙන ඉංජිනේරු තාක්ෂණ විෂයය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6) සහිත ගුරුවරයෙකු වීම.

05. *පළපුරුද්ද :*

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සඳහා —
   (i) උපාධි සුදුසුකම් සහිත ගුරුවරයෙකු නම් අවම වශයෙන් ආසන්නතම වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ
   (ii) ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු නම් අවම වශයෙන් ආසන්නතම වසර හතක (07) සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.
   (iii) ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරී ගුරුවරයෙකු නම් ආසන්නතම වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ
   (iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පති සේවයට අදාළ තනතුරක ආසන්නතම වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති විදුහල්පති සේවයේ නිලධාරියෙකු වීම.

(ආ) විශේෂ සේවක ගණය සඳහා —

(i) නියමිත විෂයයට අදාළ උපාධි ගුරුවරයෙකු වශයෙන් වසර පහක (05) සක්‍රිය සේවා කාලයක් ඇති උපාධි සුදුසුකම් සහිත ගුරුවරයෙකු නම් අවම වශයෙන් ආසන්නතම වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ

(ii) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නියමිත විෂයයට අදාළ උපාධිධාරියෙකු නම් ආසන්නතම වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ

(iii) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු නම් අවම වශයෙන් ආසන්නතම වසර හතක (07) සක්‍රිය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

(iv) කෙසේ වුව ද විශේෂ අධ්‍යාපනය/ තාක්ෂණය/ ශාරීරික අධ්‍යාපනය/ බටහිර සංගීතය යන විෂයය ක්ෂේත්‍රයන් සඳහා විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත වසර හතකට (07) නොඅඩු සේවයක් ඇති ගුරුවරයෙකු නම් විෂයයට / විෂයය ක්ෂේත්‍රයට අදාළ ගුරු පත්වීම් ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් ආසන්නතම වසර පහ (05) තුළ නියමිත විෂයය අඛණ්ඩව ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබීම.

(v) ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාව යටතේ අයදුම්කරන්නන් සඳහා ගුරු සේවයේ අදාළ සුදුසුකම් සපුරා ඇති අවම වශයෙන් ආසන්නතම වසර තුනක (03) සක්‍රිය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුදක් තිබීම.

06. *වයස් සීමාව :*

ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය.

07. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

08. *වෙනත් සුදුසුකම් :*

(i) සීමිත තරග විභාගය සඳහා කිසිදු අපේක්ෂකයෙකුට තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට අවසර නැති අතර විවෘත හා සීමිත යන තරග විභාග දෙකටම එක්ව ගත් විට පස් වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත.

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) සෑම අපේක්ෂකයෙකුම තමන් අයදුම්කිරීමට සුදුසුකම් ලබන සේවාවේ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතු ය.

(iv) අයදුම් කිරීමට සුදුසුකම් ලබන සේවයේ පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

(v) පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

09. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(i) සේවයේ 111 ශ්‍රේණියේ සේවක සංඛ්‍යාව සාමාන්‍ය සේවක සංඛ්‍යාවකින් සහ විශේෂ සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ. එක් අයදුම්කරුවෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ පහත 111 (ආ) වන ඡේදයේ සඳහන් ක්ෂේත්‍රයන්හි පුරප්පාඩු සඳහා ද අයදුම් කළ හැකිය.විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයදුම් කරනු ලබන්නේ නම් එහිදී 4.1 (ආ) හි සුදුසුකම් සපුරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන මුළු විෂයය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් 1/3ක් වත් අයදුම් කරන විෂයයට අදාළ වන විෂයයන් විය යුතු ය.

(ii) එක් අපේක්ෂකයෙකු සාමාන්‍ය සේවක සංඛ්‍යාවට හා විශේෂ සේවක සංඛ්‍යාවේ විෂයයන් කිහිපයකට තේරී පත්වුවහොත් බඳවා ගනු ලබන විෂයය තීරණය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) විශේෂ සේවක සංඛ්‍යාවේ විෂයය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත දක්වනු ලැබේ. තමා අයදුම් කරන විෂයය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

| | *සංකේත අංකය* |
|---|---|
| (අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 11 |
| (ආ) විශේෂ සේවක සංඛ්‍යාව— | |
| විෂයය ක්ෂේත්‍රය : | |
| සිංහල | 21 |
| දෙමළ | 22 |
| ඉංග්‍රීසි | 23 |
| ගණිතය | 24 |
| විද්‍යාව | 25 |
| වාණිජ්‍ය විද්‍යාව | 26 |
| තොරතුරු තාක්ෂණය | 27 |
| ශාරීරික අධ්‍යාපනය | 28 |
| බුද්ධාගම | 29 |
| ක්‍රිස්තියානි | 30 |
| හින්දු | 31 |
| ඉස්ලාම් | 32 |
| ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය | 33 |
| සංගීතය (පෙරදිග) | 34 |
| නැටුම් | 35 |
| චිත්‍ර | 36 |
| විශේෂ අධ්‍යාපනය | 37 |
| සැලසුම් | 38 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 39 |
| ඉතිහාසය | 40 |
| කෘෂි විද්‍යාව | 41 |
| ගෘහ විද්‍යාව | 42 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 43 |

| *විෂයය ක්ෂේත්‍රය* | *බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්* |
|---|---|
| 1. සිංහල<br>2. දෙමළ<br>3. ඉංග්‍රීසි හා වෙනත් භාෂා<br>4. ගණිතය<br>5. විද්‍යාව<br>6. වාණිජ විද්‍යාව<br>7. තොරතුරු තාක්ෂණය<br>8. ශාරීරික අධ්‍යාපන<br>9. බුද්ධාගම<br>10. ක්‍රිස්ත්‍රියානි<br>11. හින්දු<br>12. ඉස්ලාම්<br>13. ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය | (i) නියමිත විෂයයට අදාළ උපාධිය හෝ උපාධියේ කොටසක් ලෙස නියමිත විෂයය ප්‍රධාන විෂයයන් ලෙස හදරා තිබීම, මුළු විෂයය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් වත් අයදුම් කරන විෂයයට අදාළව හදරා තිබීම.<br>(ii) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයයට අදාළව ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබා තිබීම.<br>(සම්මුඛ පරීක්‍ෂණයේ දී සහතික මගින් සනාථ කළ යුතු ය) |
| 14. සෞන්දර්ය | නියමිත විෂයයට අදාළව උපාධි වනුයේ චිත්‍ර, නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, නාට්‍ය හා රංග කලාව විෂයය ක්ෂේත්‍රයේ උපාධි වේ. |
| 15. තාක්ෂණය<br>(ජෛව පද්ධති තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළත්ව) | (i) කෘෂි විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ගෘහ විද්‍යාව, කෘෂි විද්‍යාව, හස්ත කර්මාන්තය, ජීවන නිපුණතා සඳහා වන ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබා තිබීම.<br>(ii) තාක්‍ෂණවේදය යටතේ ඉංජිනේරු තාක්‍ෂණ විෂයය සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තාක්‍ෂණවේ දී උපාධිය හෝ යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමන තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6 ) ලබා තිබීම. |
| 16. විශේෂ අධ්‍යාපනය | (i) විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගෙන තිබීම.<br>(ii) විශේෂ අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරු විදුහලකින් ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.<br>(iii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් විශේෂ අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| 17. සැලසුම් | පහත දක්වෙන විෂයය ක්ෂේත්‍රවලින් අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් වත් ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඉන් සමත්ව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා ගෙන තිබීම.<br>*විෂය ක්ෂේත්‍රයන් :*<br>* සංඛ්‍යාන විද්‍යාව<br>* ගණිතය විෂයය<br>* කළමනාකරණය<br>* අධ්‍යාපන විද්‍යාව මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය<br>* සමාජ විද්‍යාව<br>* ජෛව විද්‍යාව<br>* භෞතික විද්‍යාව<br>* ආර්ථික විද්‍යාව |
| 18. ප්‍රාථමික අධ්‍යාපනය | (i) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේ දී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන තිබීම.<br>(ii) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරු විදුහලකින් ගුරු පුහුණු සහතිකයක් ලබා තිබීම<br>(iii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| 19. ඉතිහාසය | ඉතිහාසය විෂයය සහිත උපාධියක් ලබා ගෙන තිබීම. |

10. *බඳවා ගැනීමේ ක්‍රමය :*

10.1 ලිඛිත විභාගය

10.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

10.1.2 විෂයය නිර්දේශය

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින්(03) සමන්විත වේ. සෑම විෂයයක්ම සමත්වීම සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

(i) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 විනාඩි 30 (ලකුණු 100) - විෂයය අංකය - 01

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම බුද්ධි පරීක්ෂණ ප්‍රශ්නවලින් බලාපොරොත්තු වන අතර, ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය සහ අධ්‍යාපන ක්‍රමය ඇතුළුව අපේක්ෂකයා ජීවත්වන සහ වැඩ කරන පරිසරය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳව ඔහුගේ/ ඇයගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සාමාන්‍ය දැනීම ප්‍රශ්නවලින් බලාපොරොත්තු වේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 60 කින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(ii) තුලනාත්මක අධ්‍යාපනය - කාලය පැය 1 (ලකුණු 100) - විෂයය අංකය - 02

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා ව්‍යුහයන්, බලතල විමධ්‍යගත වී ඇති ආකාරය, මෑතකාලීන ප්‍රවණතා හා අනෙකුත් රටවල අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳව දැනුම හා සංසන්දනාත්මක අගය කිරීම් මෙම ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වේ.(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(iii) අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණය - කාලය පැය 1 (ලකුණු 100) විෂයය අංකය - 03

අධ්‍යාපන පරිපාලන / කළමනාකරණ ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම අරමුණු කර ගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

10.2 වාචික පරීක්ෂණය

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම, තර්කනය හා ගැටළු විසඳීම, සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය අනුව වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| | *විෂයය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 1. | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම | 07 |
| 2. | තර්කනය හා ගැටළු විසඳීම | 07 |
| 3. | සන්නිවේදන කුසලතා | 07 |
| 4. | පෞරුෂත්වය | 04 |
| | එකතුව | 25 |

(ii) සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත 01 හි දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) වාචික පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් වාචික පරීක්ෂණයකට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුවද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

10.3 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

මෙම නිවේදනයේ 01 (අ) ඡේදයට අනුව ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකටම පෙනී සිට ඉන් ඉහළම සාමාර්ථය ලැබූවන්ගේ කුසලතා අනුපිළිවෙලට සකසන ලද ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. ඉන් අනතුරුව රාජ්‍ය සේවා කොමිසමේ දැනුම් දීම පරිදි විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පල කරනු ඇත.

11. *විභාග කොන්දේසි :*

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම් පත්‍රයෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1,000/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන "සේවක සංඛ්‍යාව" හා ඊට අදාළ තොරතුරු අඩංගු වගුව සම්පූර්ණ කොට, අයදුම්කරුගේ අත්සන හා විදුහල්පතිගේ සහතිකය ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.*

**සටහන** : ප්‍රවේශපත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකිය හැකිය.

(vi) ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු ය. 01 සිට 04 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද, 05 සහ 06 ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන සහ හතරවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

(vii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) අපේක්ෂකයාගේ අනන්‍යතාවය : විභාගශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

සැ.යු. - (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.
රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම ඔහුගේ / ඇයගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතු ය.

(xii) මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ඩබ්.එම්. බන්දුසේන,
ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය
2015 දෙසැම්බර් මස 18 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට / විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 / 2016

Limited Competitive Examination for Recruitment to Grade 111 (General/Special) of the Sri Lanka Education
Administrative Service - 2015/2016

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට පිටපත් දෙකකින් ඉදිරිපත් කරන්න.)

විභාගයට පෙනී සිටින මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විභාගයට ඉල්ලුම් කරන ''සේවක සංඛ්‍යාව''
සාමාන්‍ය සේවක සංඛ්‍යාව පමණි - 1
විශේෂ සේවක සංඛ්‍යාව පමණි - 2
සාමාන්‍ය හා විශේෂ යන සේවක සංඛ්‍යා දෙකටම - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ඉල්ලුම් කරන සේවක සංඛ්‍යාව, විශේෂ සේවක සංඛ්‍යාවේ නම් විෂයය ක්ෂේත්‍රයේ සංකේත අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න.
(ගැසට් නිවේදනයට අදාළව)

| සේවක සංඛ්‍යාවේ නම | විෂයය ක්ෂේත්‍රයේ නම | සංකේත අංකය |
|---|---|---|
| සාමාන්‍ය | //////////////////////////////////// | |
| විශේෂ | | |
| විශේෂ | | |

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDENA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.2 පෞද්ගලික දුරකථන අංකය (තිබේනම්) :————.
2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.4 රාජකාරි දුරකථන අංකය (තිබේනම්) :————.
2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————.
2.6 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3.0 ස්ත්‍රී පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0
5.1 ජනවර්ගය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

5.2 විවාහක / අවිවාහක බව
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක - 1
විවාහක - 2

5.3 උපන් දිනය
වර්ෂය මාසය දිනය

5.4 2016.02.01 දිනට වයස
අවුරුදු මාස දින

6.0 අධ්‍යාපන සුදුසුකම් :
(අ) (i) උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලබා ගත් දිනය :————.
(වලංගු දිනය)
(ii) උපාධිය / වෙනත් සුදුසුකම (නම) :————.
(iii) හදාරන ලද ප්‍රධාන විෂයයන් :————.
(iv) විශ්වවිද්‍යාලය / ආයතනය :————.
(v) බාහිර / අභ්‍යන්තර :————.
(ආ) (i) පශ්චාත් උපාධිය සමත් දිනය :————.
(ii) පශ්චාත් උපාධිය :————.
(iii) හදාරන ලද විෂයයන් :————.
(iv) විශ්වවිද්‍යාලය / ආයතනය :————.

7.0 (i) ගුරුවරයෙකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය :————.
(ii) එම ගුරු පත්වීම ලබා දී ඇති විෂයය :————.
(iii) දැනට සේවය කරන අධ්‍යාපන කලාපය :————.
(iv) 2016.02.01 දිනට සේවා කාලය : අවු :————. මාස :————. දින :————.

8.0 (i) ගුරු පුහුණුව ලත් වර්ෂය :————.
(ii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ / ගුරු විදුහලේ නම :————.
(iii) පුහුණු සහතිකය වලංගු වන දිනය :————.
(iv) පුහුණුව ලත් විෂයය ක්ෂේත්‍රය :————.
(v) පුහුණුවට අදාළ විෂයය සඳහා ගුරු පත්වීම ලද දිනය :————.
(vi) එම පත්වීම් දින සිට 2016.02.01 දිනට සේවා කාලය : අවුරුදු :————. මාස :————. දින :————.

9.0 ඔබ දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරනු ලැබ ඇත්තේද ? :————.

10.0 ඔබ රජයේ සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

11.0 විභාග ගාස්තු

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

12. මීට ප්‍රථම සීමිත විභාගයට හා විවෘත තරග විභාගයට පෙනී සිටි වාර ගණන සහ වර්ෂයන් :————.

| විභාගය | වර්ෂයන් | වාර ගණන |
|---|---|---|
| සීමිත | | |
| විවෘත | | |

13. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................. පූජ්‍ය/ මහතා/ මහත්මිය/ මෙනවිය මගේ විද්‍යාලයේ සේවය කරන ගුරුවරයෙක් බව මෙයින් සහතික කරමි.

————,
විදුහල්පතිගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.
විභාග කොමසාරිස් ජනරාල්,
මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................ පූජ්‍ය/ මහතා/ මහත්මිය/ මෙනවිය මගේ කලාපයේ........................ සේවය කරන ගුරුවරයෙකු බවත්,අංක 05 සිට අංක 13 දක්වා වූ ඡේදවල සඳහන් කරන ලද විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)
01-266/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2015/2016

විවෘත තරග විභාගයක් මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියේ තනතුරුවල පවතින සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ හා විශේෂ සේවක සංඛ්‍යාවේ තොරතුරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය සහ ඉංජිනේරු තාක්ෂණ විෂයයන්හි පවතින පුරප්පාඩු 219 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 / 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතු ය.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය : 2016.02.01

***සටහන.***—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) පත්වීම් දීම සඳහා තෝරා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා එම ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ.වාචික පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය මෙම නිවේදනයේ අංක 9.2 යටතේ දක්වා ඇත. ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය සඳහා ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව 111 ශ්‍රේණියේ පුරප්පාඩු පුරවනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(ආ) විවෘත තරග විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන් දකුණ, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර හා උතුර යන පළාත්වල පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ස්ථානගත කරනු ලැබේ.

| විෂයය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 197 |
| තොරතුරු තාක්ෂණය | 11 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 06 |
| ජෛව පද්ධති තාක්ෂණය | 05 |

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1928/28 සහ 2015.08.21 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ 111 වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

(iv)

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුනක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු ය. සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව 7 පරිශිෂ්ඨයේ දැක්වේ.<br><br>*සටහන -*<br>නිලධාරියෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සමාර්ථයක් ලබා ඇත්නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නිලධාරියෙකු ද මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. |

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති හා කලින් කලට සිදු කරනු ලබන සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

(vi) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාවය මත මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරුවලට හෝ විශේෂ සේවක සංඛ්‍යාවේ තොරතුරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය සහ ඉංජිනේරු තාක්ෂණ විෂයයන්ට අදාළ තනතුරුවලට පත් කරනු ලැබේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 හි රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. අධ්‍යාපන සුදුසුකම් :

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සඳහා
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් ලබා තිබීම.

(ආ) විශේෂ සේවක සංඛ්‍යාව සඳහා (තොරතුරු තාක්ෂණ විෂයය හා ජෛව පද්ධති තාක්ෂණ විෂයය)
- තොරතුරු තාක්ෂණය විෂයය සඳහා තොරතුරු තාක්ෂණ විෂයයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
- තාක්ෂණවේදය විෂයය යටතේ ජෛව පද්ධති තාක්ෂණ විෂයය සඳහා කෘෂි විද්‍යාව පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

(ඇ) විශේෂ සේවක සංඛ්‍යාව සඳහා (ඉංජිනේරු තාක්ෂණ විෂයය)
යාන්ත්‍රික , ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම.

05. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා චරිතයකින් යුක්ත විය යුතු ය.;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට එක් අපේක්ෂකයෙකුට පෙනී සිටිය හැකි උපරිම වාර ගණන දෙක (02) කි.

(iv) මෙම *ගැසට් නිවේදනයේ* දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. *අයදුම්කිරීමේ ක්‍රමය :*

(i) එක් අයදුම්කරුවෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ පහත 111 (ආ) ඡේදයේ සඳහන් ක්ෂේත්‍රයන්හි පුරප්පාඩු සඳහාද අයදුම් කළ හැකිය. විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයදුම් කරනු ලබන්නේ නම් එහිදී 4 (ආ) සහ (ඇ) හි දක්වා ඇති සුදුසුකම් ලබා තිබීම අත්‍යවශ්‍ය වන අතර උපාධිය සඳහා හදාරන මුළු විෂයය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් 1/3 ක් වත් අයදුම් කරන විෂයයට අදාළ වන විෂයයන් විය යුතු ය.

(ii) එක් අපේක්ෂකයෙකු සාමාන්‍ය සේවක සංඛ්‍යාවට හා විශේෂ සේවක සංඛ්‍යාව යටතේ සඳහන් විෂයයකට තේරී පත්වුවහොත් බඳවා ගනු ලබන විෂයය තීරණය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) විශේෂ සේවක සංඛ්‍යාව යටතේ බඳවා ගනු ලබන විෂයය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත දක්වා ඇත. තමා අයදුම් කරන විෂයය ක්ෂේත්‍රය සහ ඊට අදාළ සංකේත අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

| | | *සංකේත අංකය* |
|---|---|---|
| (අ) | සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 11 |
| (ආ) | විශේෂ සේවක සංඛ්‍යාව | |
| | විෂයය ක්ෂේත්‍රය | |
| | තොරතුරු තාක්ෂණය | 27 |
| | ඉංජිනේරු තාක්ෂණය | 43 |
| | ජෛව පද්ධති තාක්ෂණය | 44 |

09. *බඳවා ගැනීමේ ක්‍රමය :*

9.1 ලිඛිත විභාගය

9.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

9.1.2 විෂයය නිර්දේශය

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ. සෑම විෂයයක්ම සමත්වීම සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

(1) අවබෝධය - කාලය පැය 1 - ලකුණු 100 (විෂයය අංකය 01)
අපේක්ෂකයාට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට ඉතා හොඳින් ගැළපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. දෙන ලද සියලු පාඨවල අර්ථය විභාග අපේක්ෂකයා විසින් වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය ඉදිරිපත් කෙරේ. මෙය අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(11) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 - ලකුණු 100 (විෂයය අංකය 02)
අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම පිණිස සකසන ලද ප්‍රශ්න පත්‍රයකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(111) සාමාන්‍ය දැනීම - කාලය පැය 1 - ලකුණු 100 (විෂයය අංකය 03)
ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය සහ අධ්‍යාපන ක්‍රමය ඇතුළුව අපේක්ෂකයා ජීවත් වන සහ වැඩකරන පරිසරය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳව අපේක්ෂකයාගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(iv) රචනය හා සාරාංශය - කාලය පැය 1 විනාඩි 30 - ලකුණු 100 (විෂයය අංකය 04)
රචනය ලිවීම සඳහා කාලීන මාතෘකා ලබාදේ. රචනයෙහි ඇතුළත් කරුණු සහ එම කරුණු සංවිධානය, ඉදිරිපත් කිරීමේ ශෛලිය හා භාෂාව, අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම හා බුද්ධිය, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තිය මැන බලනු ලැබේ. සමස්ත රචනාව ක්‍රමානුකූලව හා නිරවුල්ව සාරාංශගතව ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කෙරේ.
සාරාංශය සඳහා දෙනු ලබන ඡේදයක් හෝ ඡේද කීපයක් සාරාංශ කළ යුතු ය.

9.2. *වාචික පරීක්ෂණය*

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම, තර්කනය හා ගැටළු විසඳීම, සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය අනුව වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ. එහිදී ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| *විෂයය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම | 04 |
| 2. තර්කනය හා ගැටළු විසඳීම | 08 |
| 3. සන්නිවේදන කුසලතා | 08 |
| 4. පෞරුෂත්වය | 05 |
| එකතුව | 25 |

(ii) ලිඛිත විභාගයේදී සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) වාචික පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් වාචික පරීක්ෂණයකට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුවද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

9.3 *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :*

මෙම නිවේදනයේ 01 (අ) ඡේදයට අනුව ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකටම පෙනී සිට ඉන් ඉහළම සාමාර්ථය ලැබූවන්ගේ කුසලතා අනුපිළිවෙලට සකසන ලද ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. ඉන් අනතුරුව රාජ්‍ය සේවා කොමිසමේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

10. විභාග කොන්දේසි :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම් පත්‍රයෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1000/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
*ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන ''සේවක සංඛ්‍යාව'' හා ඊට අදාළ තොරතුරු අඩංගු වගුව සම්පූර්ණකොට, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදාළනම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

***සටහන*** : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vi) ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු ය. 01 සිට 04 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 05 සිට 06 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය තුන්වන හා හතරවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. මෙම *ගැසට් නිවේදනයේ* දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

(vii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :* විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

***සැ.යු.*** - (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.
(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(xii) මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ඩබ්.එම්. බන්දුසේන,
ලේකම්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 / 2016
Open Competitive Examination for Recruitment to Class 111 of the Sri Lanka Education Administrative Service - 2015/2016

විභාගයට පෙනී සිටින මාධ්‍ය :

| | | |
|---|---|---|
| සිංහල | - | 2 |
| දෙමළ | - | 3 |
| ඉංග්‍රීසි | - | 4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විභාගයට ඉල්ලුම් කරන ''සේවක සංඛ්‍යාව''
සාමාන්‍ය සේවක සංඛ්‍යාව පමණි - 1
විශේෂ සේවක සංඛ්‍යාව පමණි - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සාමාන්‍ය හා විශේෂ යන සේවක සංඛ්‍යා දෙකටම - 3

ඉල්ලුම් කරන සේවක සංඛ්‍යාව, විශේෂ සේවක සංඛ්‍යාවේ නම් විෂයය ක්ෂේත්‍රයේ සංකේත අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න.
(ගැසට් නිවේදනයට අදාළව)

| *සේවක සංඛ්‍යාවේ නම* | *විෂයය ක්ෂේත්‍රයේ නම* | *සංකේත අංකය* |
|---|---|---|
| සාමාන්‍ය | ////////////////////////////////////// | |
| විශේෂ | | |
| විශේෂ | | |

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදා : GUNAWARDENA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :—————.

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :—————.
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
2.4 පෞද්ගලික දුරකථන අංකය (තිබේ නම්) :—————.

3.0 ස්ත්‍රී පුරුෂ භාවය :
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0
5.1 ජනවර්ගය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

5.2 විවාහක / අවිවාහක බව :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක - 1
විවාහක - 2

5.3 උපන් දිනය :
වර්ෂය මාසය දිනය

5.4 2016.02.01 වැනි දිනට වයස :
අවුරුදු මාස දින

6.0 *මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය සමත් වූ භාෂා මාධ්‍යය* :—————.

7.0 *අධ්‍යාපන සුදුසුකම්* :
7.1 උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලද දිනය :—————.
7.2 විශ්වවිද්‍යාලය / ආයතනය :—————.
7.3 විශ්වවිද්‍යාලයේ / ආයතනයේ ලියාපදිංචි අංකය :—————.
7.4 බාහිර / අභ්‍යන්තර :—————.
7.5 උපාධිය / වෙනත් සුදුසුකම් :—————.
7.6 විෂයයන් :—————.
7.7 පන්තිය :—————.
7.8 ඉහළ / පහළ :—————.
7.9 විභාග අංකය :—————.
7.10 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

8.0 2010, 2013 වර්ෂවල පවත්වන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගවලට පෙනී සිටියේද යන්න සඳහන් කරන්න. ( ලකුණ යොදන්න)

| *වර්ෂය* | *ඔව්* | *නැත* |
|---|---|---|
| 2010 | | |
| 2013 | | |

9.0 *විභාග ගාස්තු* :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

10. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............................ හා ............................ දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියාකිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට අනුව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*අත්සන සහතික කිරීම*

මෙහි අත්සන් කරන ලද ................................ හි පදිංචි ...................................... පූජ්‍ය/මහතා/ මහත්මිය/ මෙනවිය මම පුද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු / ඇය ගේ අත්සන මා ඉදිරිපිටදී තැබූ බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය* :
(රාජ්‍ය / පළාත් රාජ්‍ය / රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................ මහතා / මහත්මිය / මෙනවිය, මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............................ ලෙස සේවය කරන අතර, ඔහුගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාව තබන්න.)

01-266/2

---

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

2015.12.11 වැනි සිකුරාදා අංක 1945 දරන *ගැසට් පත්‍රයේ* පළවූ 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිසුන් බඳවා ගැනීමේ *ගැසට් නිවේදනය* පහත පරිදි සංශෝධන වේ.

### උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

01-79

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට
බඳවා ගැනීමේ තරග විභාගය 2015 / 2016

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියේ තනතුරු වල පවතින සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 118 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සම්පූර්ණ කර තිබිය යුතුය. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2015 / 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතු ය.

*අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය* : 2016.02.01

***සටහන.***— ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

(*අ*) ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් ලිඛිත විභාගයෙන් හා සේවා පළපුරුද්ද යන අංශ දෙකෙන්ම ලැබූ මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පත්වීම සඳහා තෝරාගනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

(*ආ*) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයෙකු නියමිත සුදුසුකම් සපුරා නොතිබේ නම්, කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළග අපේක්ෂකයා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1928/28 සහ2015.08.21 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ 111 වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු (01) වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

(iv)

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුනක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු ය. සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 7 පරිශිෂ්ඨයේ දැක්වේ.<br>***සටහන.***—<br>නිලධාරියෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සමාර්ථයක් ලබා ඇත්නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නිලධාරියෙකු ද මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. |

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

(vi) 111 ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාවය මත මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරුවලට පත් කරනු ලැබේ.

03. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 හි රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *සුදුසුකම්* :

පහත සඳහන් සුදුසුකම් තිබෙන, දැනට සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පත් කරනු ලැබීම සඳහා වන විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

(i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ අවුරුදු 03ක අවම සේවා කාලයක් තිබීම. (තුන් අවුරුදු සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනටය.)
(ii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථිර කර තිබීම.
(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව හෝ ඉන් නිදහස්ව තිබීම.
(iv) සියලුම අයදුම්කරුවන් සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***සටහන .***—ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියකු මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සකු නොවේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වනු ඇත.

05. *සුදුසුකම්* :

5.1 *කායික සුදුසුකම්* :
(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.2 *වෙනත් සුදුසුකම්* :
(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය. :
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය. :
(iii) සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැති අතර, සීමිත සහ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම සඳහා වන විභාග දෙකටම පස් වරකට වඩා (05) පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත.
(iv) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සේවා පළපුරුද්ද හා කුසලතාව තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. වයස් සීමාව :

ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

07.බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 ලිඛිත විභාගය
මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

7.1.1 විෂයය නිර්දේශය
ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් සමන්විත වේ. සෑම විෂයක්ම සමත්වීම සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

- 1979 අංක 64 දරන පිරිවෙන් පනත
- 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන - සංශෝධන පනත)
- 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත

(ආ) අධ්‍යාපන පරිපාලනය :
(1) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති
(i). අධ්‍යාපන අමාත්‍යාංශය,
(ii) දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්
(iii) ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් අධ්‍යාපනික සැලසුම් සකස් කිරීම, පරමාර්ථ, ක්‍රම (පාසල් සැකසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය
(2) පාසල් කළමනාකරණය, පාසල් ප්‍රජා සම්බන්ධතා
(3) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය
(4) විශේෂ අධ්‍යාපන වැඩසටහන්

(ඇ) අධ්‍යාපන අධීක්ෂණය :
- පාසැල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන
- පාසල්වල අඛණ්ඩ ඇගයීම් වැඩසටහන්
- පාසල්වල ස්වයං ඇගයීම් වැඩසටහන්
- දිස්ත්‍රික්, දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම
- බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය (අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)

නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන :
- අධ්‍යාපන සැලසුම් හා පරිපාලනය පිළිබඳ ආසියාතික ආයතන (1970)
- අධ්‍යාපන පරිපාලනය පිළිබඳ නව කළමනාකරණ ශිල්පීය ක්‍රම
- සම්මන්ත්‍රණයක වාර්තාවක් - නවදිල්ලිය
- බැරි සහ ටයි (1975) පාසැලක් පවත්වාගෙන යාම ටෙම්පල් ස්මිත් ලන්ඩන්
- බුෂ් ටී ග්ලැටර් ආර්. ගුඩ් සහ සී. රිවස් (1980) පාසැල්
- කළමනාකරණ විධි, හාර්පර් සහ රෝ
- ආචාර්ය කාන් මොහිදීන් ෂෙරිෆ් 1983
- පාසල් පරිපාලනය - නවදිල්ලිය
- අධ්‍යාපන අමාත්‍යාංශය ලංකාවේ අධ්‍යාපනය (1969)
- අධ්‍යාපන හා සංස්කෘතික වැඩ කටයුතු අමාත්‍යාංශයේ ශත සංවත්සරික කාණ්ඩය II වන හා III වන කොටස්
- විවෘත විශ්වවිද්‍යාලය (1981) පාසල්වල ප්‍රතිපත්ති සම්පාදනය සංවිධානය හා නායකත්වය (ඊ 323 පාඨමාලාවේ 4 වන කොටස ) විවෘත විශ්ව විද්‍යාලය, යුනිවර්සිටි ප්‍රෙස්, ලන්ඩන් , ෂිප්මන්, මර්ටන් (1983) පාසලෙහිම ඇගයීම හයිස්මන් අධ්‍යාපන පොත් ලන්ඩන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තාව - 1984

04. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුලු ලකුණු ප්‍රමාණය 100 කි. සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු ය.

05. *විභාගයේ භාෂා මාධ්‍යය* :
(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එක් භාෂා මාධ්‍යයකින් පිළිතුරු ලිවිය හැක.
(iii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුලුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුලුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

06. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. ඉල්ලුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පතෙහි අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු වන පිටුවෙහිත් ඉතිරිය දෙවන හා තුන්වන පිටුවලට ද වන ලෙස සඳහන් කරන්න.) සිංහල අයදුම්පත්‍රයේ විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රයේ විභාගයේ නම දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය. අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව ද සලකන්න.

08. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

09. ඉල්ලුම්පත්‍ර 2016.02.01 දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලිපිකවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම ද සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත සමඟ. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2/3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී ඔබ ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමඟ ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත. ෆැක්ස් අංකය 011 - 2784232) ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන්න.
(I) විභාගයේ නම :-
(II) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :-
( III) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :-
(IV) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය හා තැපැල් කාර්යාලය :-

11. ඉහත 09 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

12. (i) සෑම අපේක්ෂකයෙකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම් වන අතර ඒ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදෙස් ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම (තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).
(අ) පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.)
(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා-
සම්පූර්ණ විභාගය සඳහා රු. 1,000.00 යි
එක් විෂයයකට රු. 500.00 යි

14. (i) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.
(ii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

[ ] (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ඉල්ලුම් පත්‍රය**

***ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015***

FIRST EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN CLASS III OF THE SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE - 2015

නිලධාරියා විභාගයට පෙනී සිටින *භාෂා මාධ්‍යය* : සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.
උදා:- GUNAWARDHANA, H.M.S.K.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :
(i) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iv) දුරකථන අංකය :————.

03. නිවේදනයේ 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

විෂයය අංකය :- [ | ] විෂයය :——
විෂයය අංකය :- [ | ] විෂයය :——
විෂයය අංකය :- [ | ] විෂයය :——
[ | ]

04. ජාතික හැඳුනුම්පත් අංකය :- [ | | | | | | | | | ]

05. උපන් දිනය :
වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

06. ස්ත්‍රී / පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. (1) පදවි නාමය :————.
(11) දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය/පාසල :————.

08. මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය, විෂයය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *වර්ෂය* | *විෂයය* | *මාධ්‍යය* |
|---|---|---|
| ……………… | ……………… | ……………… |
| ……………… | ……………… | ……………… |
| ……………… | ……………… | ……………… |

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :-
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළඟ තබා ගන්න. අදාළ නම් පමණි) |
|---|

10. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, අයදුම්පත්‍රයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලුම නීති රීතිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට /අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ ඔහු/ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බව ද ප්‍රකාශ කරමි (★)

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව.

2015 ක් දෙසැම්බර් මස 11 වැනි දින
(★) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.
01-88

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු සඳහා බටහිර සංගීත උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම-2015

දිවයිනේ පිහිටි රජයේ පාසල්වල පවතින බටහිර සංගීත ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් බටහිර සංගීත උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 යෝග්‍යතා:-

1.1 *සාමාන්‍ය සුදුසුකම්* :
I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය,
II. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
III. 2016.01.14 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය,

1.2 *අධ්‍යාපන සුදුසුකම් හා අවශ්‍ය මූලික සුදුසුකම්* :
I ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2016.01.14 දිනට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පිළිගත් ඕනෑම විශ්ව විද්‍යාලයකින් ප්‍රායෝගික පුහුණුව සහිත බටහිර සංගීතය පිළිබඳ' උපාධියක් ලබා තිබිය යුතු ය,
II අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතු ය :-
* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී අනුයාත වසර 2 ක් තුල දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත්විය යුතු ය,
* අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් නව විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම.

*සටහන.*— විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1 සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉදිරියේදී තරග විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එමගින් ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන, පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

2.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේදී සුදුස්සන් තෝරා ගැනීම සඳහා ලකුණු ලබා දීමේ පටිපාටිය අංක 1 උපලේඛනයේ සඳහන් වේ.

**උපලේඛනය 01**

ඉහත 1.2 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන පහත දක්වා ඇති කොටස් 03කින් යුත් ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එක් කොටසකින් 40% බැගින් කොටස් තුනෙන්ම අවම වශයෙන් ලකුණු 120ක් ලබා තිබිය යුතු වේ.
(i) බටහිර සංගීත සිද්ධාන්ත,
(ii) බටහිර සංගීත විෂයයට අදළ ශ්‍රවණ පරීක්ෂණය,
(iii) බටහිර සංගීත විෂයයට අදළ ප්‍රයෝගික පරීක්ෂණය.

ඉහත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය පදනම් කර ගෙන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

2.3 උපලේඛනය 2 හි සඳහන් ගුරු පුරප්පාඩු අතුරින් පාසල් 03ක් පමණක් එක් අයදුම්කරුවෙක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර තම කැමැත්ත මත ඉල්ලුම් කරනු ලබන පාසල හා එහි අනුපිළිවෙල පසුව වෙනස් කළ නොහැක.

2.4 තරග විභාගයට අදළ විෂය නිර්දේශය :-

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයැදුම්කරුවන් මෙම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ. විභාගය සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතු වේ.

01 අභියෝග්‍යතාව - කාලය පැය 01 1/2යි (ලකුණු 100යි)

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

02 සාමාන්‍ය දැනුම - කාලය පැය 01 1/2 යි, (ලකුණු 100 යි )

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබද සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

2.5 *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

***සටහන.***—

ඉල්ලුම් කරනු ලබන පාසලේ පවතින විෂයයට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති අවස්ථාවකදී තරග විභාගයේදී ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ සහ ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ. අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

2.6 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙක් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2014.12.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (XII) අනුව වන අතර මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජී-ඊ-1-2006 දරන, වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 13,410 -145 x 6 - 180 x 7 - 215 x 2 රු. 15,970 /- වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 15,540/- ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

2.7 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2.8 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක : 1885/38, දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ,ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 හි සඳහන් විධිවිධාන, අනුව බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදු කරනු ඇත. එමෙන්ම මෙම *ගැසට් නිවේදනයෙන්* ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

03. *අයදුම් කිරීමේ ක්‍රමය* :

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 6.4 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේ ද, 7.0 සිට ඉදිරියට ශීර්ෂ පිළිවෙළින් අනෙකුත් පිටුවලට වන පරිදි තම අයැදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට

අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

3.2 අයදුම් කරනු ලබන විෂයය හා පාසල් අනුපිළිවෙළ කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.,

3.3 එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි,

3.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

3.5 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.01.14 දිනට හෝ ඊට පෙර, "විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ", යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ, "රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු සඳහා බටහිර සංගීත උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම-2015" ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

3.6 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

3.7 අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

04. *විභාගයට ඇතුළුවීම :-*

4.1 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4.2 අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත්වීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

5. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහිමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

6. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :-*

6.1 අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයක දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත්කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකිරීමට යටත් වේ.

7. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 500/-කි, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් /උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයැදුම්කරුගේම නමට ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න, (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් හෝ නොකරනු ලැබේ.

8. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :- අයදුම්පත පිරවීමේ දී පහත උපලේඛන 2 භාවිතා කරන්න.

**උපලේඛනය 02**

***සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය***

බටහිර සංගීත විෂයයට විෂයය

බටහිර සංගීත ගුරු භවතුන් බඳවා ගැනීම - ගුරු පුරප්පාඩු

| අනුක්‍රමික අංකය | *බස්නාහිර පළාත ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ඩී. එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, බේරුවල | 1 |
| 2 | ශාන්ත ජෝන් විද්‍යාලය, කළුතර | 1 |
| | | |
| | **එකතුව** | **2** |

| අනුක්‍රමික අංකය | *දකුණු පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 3 | ශ්‍රී දේවානන්ද විද්‍යාලය, අම්බලන්ගොඩ | 1 |
| 4 | රුහුණු විජයබා මහා විද්‍යාලය, හම්බන්තොට | 1 |
| 5 | ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, ඇල්පිටිය | 1 |
| 6 | කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය, කරන්දෙණිය | 1 |
| 7 | බටේමුල්ල මධ්‍ය මහා විද්‍යාලය, ඉමදූව | 1 |
| 8 | දේවපතිරාජ විද්‍යාලය, රත්ගම | 1 |
| 9 | ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය, හික්කඩුව | 1 |
| 10 | ශ්‍රී ලංකා සිංගප්පූරු මිත්‍රත්ව ජාතික පාසල, වීරකැටිය | 1 |
| 11 | ශ්‍රී රේවත ජාතික පාසල, අම්බලන්ගොඩ | 1 |
| 12 | ධර්මාශෝක විද්‍යාලය, අම්බලන්ගොඩ | 1 |
| 13 | දෙනියාය මධ්‍ය මහා විද්‍යාලය, දෙනියාය | 1 |
| 14 | කීර්ති අබේවික්‍රම මධ්‍ය මහා විද්‍යාලය, මොරවක | 1 |
| 15 | ශා. මේරි ජාතික පාසල හම්බන්තොට | 1 |

| අනුක්‍රමික අංකය | *දකුණු පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 16 | දෙබරවැව ජාතික පාසල, තිස්සමහාරාම | 1 |
| 17 | සූරියවැව ජාතික පාසල, සූරියවැව | 1 |
| 18 | වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලය, හම්බන්තොට | 1 |
| 19 | තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය, මාතර | 1 |
| 20 | වලස්මුල්ල ජාතික පාසල, වලස්මුල්ල | 1 |
| 21 | තංගල්ල බාලිකා විද්‍යාලය, තංගල්ල | 1 |
| 22 | ඌරුබොක්ක මධ්‍ය මහා විද්‍යාලය, ඌරුබොක්ක | 1 |
| | **එකතුව** | **20** |

| අනුක්‍රමික අංකය | *මධ්‍යම පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 23 | අමුපිටිය මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 24 | තෙල්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| 25 | විජය ජාතික පාසල, මාතලේ | 1 |
| 26 | ක්‍රිස්තුදේව ජාතික පාසල, මාතලේ | 1 |
| 27 | ශ්‍රී සුමංගල ජාතික පාසල, වලපනේ | 1 |
| 28 | පාක්‍යම් දෙමළ ජාතික පාසල, මාතලේ | 1 |
| 29 | ශ්‍රී නාග ජාතික පාසල, නාවුල | 1 |
| 30 | නුගවෙල බාලිකා මධ්‍ය මහා විද්‍යාලය, මහනුවර | 1 |
| | **එකතුව** | 8 |

| අනුක්‍රමික අංකය | *වයඹ පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 31 | වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල | 1 |
| 32 | ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, හලාවත | 1 |
| 33 | ආනන්ද ජාතික පාසල, පුත්තලම | 1 |
| 34 | සේනානායක ජාතික පාසල මාදම්පේ | 1 |
| 35 | එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක විද්‍යාලය, පඬුවස්නුවර | 1 |
| | | |
| | **එකතුව** | **5** |

| අනුක්‍රමික අංකය | *ඌව පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 36 | වැලිමඩ මහා විද්‍යාලය, වැලිමඩ | 1 |
| 37 | ශාන්ත ජෝසෙප් විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 38 | කන්දේගෙදර මහා විද්‍යාලය, කන්දේගෙදර | 1 |
| 39 | බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 40 | කුඩා කුසුම් බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 41 | පස්සර මධ්‍ය මහා විද්‍යාලය, පස්සර | 1 |
| 42 | විශාඛා බාලිකා විද්‍යාලය, බණ්ඩාරවෙල | 1 |
| 43 | කහගොල්ල මධ්‍ය මහා විද්‍යාලය, කහගොල්ල | 1 |
| 44 | නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලය, බඩල්කුඹුර | 1 |
| 45 | වෙල්ලස්ස ජාතික පාසල, වෙල්ලස්ස | 1 |
| | | |
| | **එකතුව** | **10** |

| අනුක්‍රමික අංකය | *නැගෙනහිර පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 46 | වින්සෙන්ට් උසස් බාලිකා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 47 | ශිවානන්ද ජාතික පාසල, මඩකලපුව | 1 |
| 48 | ශා. මායිකල් ජාතික පාසල, මඩකලපුව | 1 |
| 49 | පදිරිප්පු මධ්‍ය මහා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 50 | ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය, අක්කරෙයිපත්තුව | 1 |
| 51 | ඩී. එස්. සේනානායක විද්‍යාලය, අම්පාර | 1 |
| 52 | කාමෙල් ෆාතිමා ජාතික පාසල, කල්මුනේ | 1 |
| 53 | දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල දෙහිඅත්තකණ්ඩිය | 1 |
| | | |
| | **එකතුව** | 8 |

| අනුක්‍රමික අංකය | *උතුරු මැද පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 54 | මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලය, මැදිරිගිරිය | 1 |
| 55 | රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, පොළොන්නරුව | 1 |
| 56 | ආනන්ද බාලිකා විද්‍යාලය, හිඟුරක්ගොඩ | 1 |
| | | |
| | **එකතුව** | 3 |

| අනුක්‍රමික අංකය | *උතුරු පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 57 | වෙම්බඩි උසස් බාලිකා විද්‍යාලය | 1 |
| 58 | හින්දු විද්‍යාලය, යාපනය | 1 |
| 59 | යාපනය මධ්‍ය මහා විද්‍යාලය, යාපනය | 1 |
| 60 | ශා. සේවියර් බාලිකා විද්‍යාලය, මන්නාරම | 1 |
| 61 | ශා. සේවියර් පිරිමි විද්‍යාලය, මන්නාරම | 1 |
| | **එකතුව** | 5 |

| අනුක්‍රමික අංකය | *සබරගමු පළාත - ජාතික පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 62 | ඇඹිලිපිටිය ජනාධිපති ජාතික පාසල, ඇඹිලිපිටිය | 1 |
| 63 | කලවාන ජාතික පාසල කලවාන | 1 |
| 64 | කෑ/ඩඩ්ලි සේනානායක ජාතික පාසල | 1 |
| 65 | ජෙයිලනි මධ්‍ය මහා විද්‍යාලය, දෙහිගස්තලව | 1 |
| 66 | කොළොන්න මධ්‍ය මහා විද්‍යාලය | 1 |
| | | |
| | **එකතුව** | 5 |

| අනුක්‍රමික අංකය | *බස්නාහිර පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 67 | ශා. අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 09 | 1 |
| 68 | ජයවර්ධනපුර පිරිමි විද්‍යාලය, කෝට්ටේ | 1 |
| 69 | ශා. මරියා විද්‍යාලය, මතුගම | 1 |
| 70 | නාලන්ද බාලිකා මහා විද්‍යාලය, මිනුවන්ගොඩ | 1 |
| 71 | බියගම මධ්‍ය මහා විද්‍යාලය, බියගම | 1 |
| | | |
| | **එකතුව** | 5 |

| අනුක්‍රමික අංකය | *දකුණු පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 72 | ශාන්ත අන්තෝනි විද්‍යාලය, ගාල්ල | 1 |
| 73 | ජනාධිපති විද්‍යාලය, මාතර | 1 |
| 74 | අකුරැස්ස මධ්‍ය මහා විද්‍යාලය, අකුරැස්ස | 1 |
| 75 | මෙතෝදිස්ත මහා විද්‍යාලය, මාරවිල | 1 |
| 76 | පුවක්දන්ඩ මධ්‍ය මහා විද්‍යාලය, බෙලිඅත්ත | 1 |
| | | |
| | **එකතුව** | 5 |

| අනුක්‍රමික අංකය | *මධ්‍යම පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 77 | ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය, ගලේවෙල | 1 |
| 78 | ශා. අන්තෝනි විද්‍යාලය, මහනුවර | 1 |
| 79 | යහපත් එඬේරගේ කන්‍යාරාමය, නුවරඑළිය | 1 |
| 80 | ශා. සිල්වෙස්ටර් විද්‍යාලය, මහනුවර | 1 |
| 81 | ශා. අන්තෝනි බාලිකා විද්‍යාලය, මහනුවර | 1 |
| 82 | පේරාදෙණිය මධ්‍ය මහා විද්‍යාලය, පේරාදෙණිය | 1 |
| 83 | වාරියපොළ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය, මහනුවර | 1 |
| 84 | වත්තේගම බාලිකා විද්‍යාලය, වත්තේගම | 1 |
| | | |
| | **එකතුව** | 8 |

| අනුක්‍රමික අංකය | *වයඹ පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 85 | මාරවිල ශා. ෂේවියර් විද්‍යාලය, නාත්තන්ඩිය | 1 |
| | **එකතුව** | 1 |

| අනුක්‍රමික අංකය | *ඌව පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 86 | ගිරාඳුරුකෝට්ටේ මධ්‍ය මහා විද්‍යාලය, ගිරාඳුරුකෝට්ටේ | 1 |
| 87 | විහාරමහාදේවි බාලිකා මහා විද්‍යාලය, බදුල්ල | 1 |
| | | |
| | **එකතුව** | 2 |

| අනුක්‍රමික අංකය | *නැගෙනහිර පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 88 | මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලය, මඩකලපුව | 1 |
| 89 | හින්දු විද්‍යාලය, මඩකලපුව | 1 |
| 90 | විවේකානන්ද බාලිකා මහා විද්‍යාලය, මඩකලපුව | 1 |
| | **එකතුව** | 3 |

| අනුක්‍රමික අංකය | *උතුරුමැද පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 91 | ගිරිතලේගම මහා විද්‍යාලය | 1 |
| 92 | ශා. ජෝසප් මහා විද්‍යාලය, අනුරාධපුර | 1 |
| 93 | මිහින්තලේ මහා විද්‍යාලය | 1 |
| | | |
| | **එකතුව** | 3 |

| අනුක්‍රමික අංකය | *උතුරු පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 94 | ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - යාපනය | 1 |

| අනුක්‍රමික අංකය | *සබරගමුව පළාත් පාසල්* | ගුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 95 | ශ්‍රී/බුද්ධජයන්ති ම. ම. වි., බලංගොඩ | 1 |
| 96 | කරගස්තලාව ම. වි., බෙලිහුල්ඔය | 1 |
| 97 | උඩුගම ම. වි. පින්නවල, බලංගොඩ | 1 |
| 98 | ශ්‍රී/වලගම්බා ම. වි. වැලිගෙපොල, බලංගොඩ | 1 |
| 99 | විද්‍යාකර ම. වි., ඕපනායක | 1 |
| 100 | චන්ද්‍රිකාවැව ජයන්ති ම. වි., පදලන්ගල | 1 |
| 101 | කොළඹගෙආර ම. වි., කොළඹගෙආර | 1 |
| 102 | ඇඹිලිපිටිය ම. වි., ඇඹිලිපිටිය | 1 |
| 103 | මොරකැටිය ම. වි., ඇඹිලිපිටිය | 1 |
| 104 | උඩවලව ම. වි., උඩවලව | 1 |
| 105 | රත්නාලෝක ම. වි., රක්වාන | 1 |
| 106 | කැල්ල ම. වි., කොළොන්න | 1 |
| 107 | විජේරිය සුමන ම. වි., විජේරිය | 1 |
| 108 | අයගම ශ්‍රී රාහුල ම. ම., වි., රත්නපුර | 1 |
| 109 | කහවත්ත ම. ම. වි., කහවත්ත | 1 |
| 110 | කලාවන ගාමිණී ම. ම. වි., කොස්වත්ත, කලාවන | 1 |
| 111 | මීපාගම ජයන්ති ම. වි., කලාවන | 1 |
| 112 | ඇලපාත ම. වි. ඇලපාත, රත්නපුර | 1 |
| 113 | ශ්‍රී රත්නාකර ම. වි., උඩකරවිට | 1 |
| 114 | ශ්‍රී ජිනරතන ම. වි. කරදන | 1 |
| 115 | සිද්ධාර්ථ ම. වි., ගැටහැත්ත | 1 |
| 116 | කිරිඇල්ල ගාමිණී ම. වි., කිරිඇල්ල | 1 |
| 117 | කුරුවිට ම. ම. වි., කුරුවිට | 1 |
| 118 | ධර්මාලෝක ම. වි., පැල්මඩුල්ල | 1 |
| 119 | කුමාර විද්‍යාලය, රත්නපුර | 1 |
| 120 | බඹරබොටුව ම. වි., වේවැල්වත්ත, රත්නපුර | 1 |
| 121 | තල්දුව බෞද්ධ මහා විද්‍යාලය, අවිස්සාවේල්ල | 1 |
| 122 | අමිතිරිගල ම. වි., අමිතිරිගල | 1 |
| 123 | වහරක මහා විද්‍යාලය | 1 |
| 124 | රත්නාවලී ම. වි., මත්තමගොඩ, කන්නන්තොට | 1 |
| 125 | සිරිවර්ධන ම. වි., යටියන්තොට | 1 |
| 126 | දැඩිගම පැරකුම්බා ම. වි., තුන්තොට | 1 |
| 127 | ගලිගමුව ම. ම. වි., ගලිගමුව, නවනගරය | 1 |
| 128 | බණ්ඩාරනායක ම. වි., හෙට්ටිමුල්ල | 1 |
| 129 | මාබෝපිටිය ම. වි., මාබෝපිටිය, උදුගොඩ | 1 |
| 130 | මහානාග ම. වි., රංවල, කෑගල්ල | 1 |
| 131 | ස්වර්ණජයන්ති ම. වි., කෑගල්ල | 1 |
| 132 | අල්ගම ම. ම. වි., අල්ගම | 1 |
| 133 | බාබුල් හෂින් මුස්ලිම් ම. වි., වරකාපොල | 1 |
| 134 | ධර්මසිරි සේනානායක ම. වි., තුල්හිරිය | 1 |
| 135 | සිරිනිවස ම. වි., දොරවක | 1 |
| 136 | රාජගිරි ම. වි., දිප්පිටිය අරනායක | 1 |

**දැන්වීමයි**

පහත සඳහන් සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| සමාගමෙ නම | සමාගමේ අංකය | ලියාපදිංචි කාර්යාලය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|---|
| සිලෝන් ෆ්‍රැන්චයිස්පී චෙම්බර්ස් (පීවීටී) එල්ටීඩී | වී 109835 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.11.16 |
| ද ෆෝලන් ට්‍රී රිසෝට් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 109785 | ''ලුම්බිණි'' වගුරුවෙල, බුත්තල | 2015.11.16 |
| ඩෙක්ස් ඇන්ඩ් කැබින්ස් (පීවීටී) එල්ටීඩී | පී වී 110209 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.12.02 |
| ෆෝචූන් 20 ටුවෙන්ටි (පී වී ටී) එල්ටීඩී | පී වී 110211 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.12.07 |

ලීඩ්ස් කෝපරේට් ස්ර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 98/2, ජාවත්ත පාර,
කොළඹ 5.
01-257

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

කොළඹ 13, විවේකානන්ද පාර, අංක ඩී/2/1 දරන ස්ථානයේ පදිංචි රණසිංහ ආරච්චිගේ ඇනස්ටින් පෙරේරා වන මා විසින් කොළඹ 13, විවේකානන්ද පාර, ජාතික නිවි හැම්, අංක ඩී/2/1 දරන ස්ථානයේ පදිංචි දොන් අසන්ත අරුන්දික මායාදුන්න යන අයට මා විසින් ලබා දී ඇති වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින එම්. අයි. එම්. මුබාරක් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 13532 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කරන බව දන්වා සිටිමි.

ආර්. ඒ. ඒ. පෙරේරා.

01-02

---

**දැනුම්දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.
සමාගම් නාමය : ජර්නිස්කේප්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 109665
ලියාපදිංචි කාර්යාලය : අංක 8, 2 වැනි පටුමග, දෙහිවල
සංස්ථාගත දිනය : 2015.11.06

සමාගම් ලේකම්වරු.

01-04

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.
සමාගමේ නම : ධූර්කා ඉම්පෝට්ස් ඇන්ඩ් එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109951
ලියාපදිංචි දිනය : 2015.11.23
